**සමූපකාර සංවර්ධන අරමුදල - 2014**

**--------------------------------------**

සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමූපකාර සංවර්ධන අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධි විධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**--------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ .

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට සමූපකාර සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 350,000 ක් වූ ගොඩනැගිල්ල සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුනි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2** **පැහැදිලි නොකළ වෙනස්කම්**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමූපකාර සමිති ණය සහ ලැබිය යුතු ණය පොලි ශේෂයන් 02 හි එකතුව රු.31,490,195 ක් වුවද උපලේඛනය අනුව එම එකතුව රු.55,080,989 ක් වූයෙන් රු.23,590,794 ක වෙනසක් පැවතුණි.

**2.2.3** **විගණනය සඳහා සාක්ෂි නොවීම**

එකතුව රු.50,799,611 ක් වූ සමූපකාර සමිති ණය, කෘෂි අරමුදල් සමිති ණය, විදුහල් ණය, ලොරි රථ ණය හා කෘෂි අරමුදල් ශේෂ සම්බන්ධයෙන් ශේෂ සනාථ කිරීම්, කාල විශ්ලේෂණ හා විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**2.3** **ලැබිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.3,183,600 ක් වූ කාර්ය සාධන අත්තිකාරම් හා ලැබිය යුතු උසාවි වන්දි වසර 06 ක කාලයක සිට අයකර ගෙන නොතිබුණි.

(ආ) 2008 වර්ෂයේ සිට ජංගම වත්කම් යටතේ දක්වා තිබුණු රු.2,411,653 ක්වූ අගරු චෙක්පත්වලට අදාල ණයගැතියන් හඳුනාගෙන එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවතුන රජයේ ගිණුමෙන් ලැබිය යුතු රු.180,394 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයවී නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 188(2) | 2011 හා 2012 වර්ෂයට අදාල එකතුව රු.300,101 ක් වූ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් 04 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 396 | 2010, 2012, 2013 හා 2015 වර්ෂයන්ට අදාලව නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ මාස 06 සිට වසර 04 දක්වා එකතුව රු.54,964 ක් වූ චෙක්පත් 07 ක් සම්බන්ධයෙන් 2016 අගෝස්තු 31 දින වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 31 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබුණි. |
| (ඇ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | |
| (i) 4.1 ඡේදය | සමාලෝචිත වර්ෂයේ වාර්ෂික අයවැය ලේඛනය අදාල අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් හා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 4.2 ඡේදය | අරමුදල් සඳහා පවත්වා ගෙන යනු ලබන වෙනම බැංකු ගිණුම සහ පොත්පත් නිතිපතා සසඳා ප්‍රගතිය පිළිබඳ එක් එක් කාර්තුව සඳහා වූ වාර්තා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) 4.3 ඡේදය | ගිණුම් වර්ෂය අවසන් වී මාස 2 ක් ඇතුළත සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ සමුච්චිත අරමුදලේ වෙනස්කම් දැක්වෙන ප්‍රකාශයක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාට පිටපතක් සහිතව විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.11,998,614 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,699,969 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.16,698,583 ක පිරිහීමක් නිරීක්ෂණය විය. වෙනත් වියදම් රු.20,132,234 කින් අඩු වී තිබුණද දායක මුදල් ආදායම් රු.15,360,377 කින් අඩු වීම හා ආධාර රු.18,414,346 කින් වැඩිවීම ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී, 2011 හා 2014 වර්ෂයන්හිදී ඌනතාවයක් පැවති අතර 2010, 2012 හා 2013 වර්ෂයන්හිදී මූල්‍ය අතිරික්තයක් පැවතුනි.කෙසේ වුවද, සේවක පාරිශ්‍රමික හා ක්ෂය සැලකීමේදී 2011 හා 2014 වර්ෂයන්හිදී පිළිවෙලින් රු.155,473,139 ක් හා රු.10,636,877 ක ඌනතාවයක් පැවති අතර, 2010, 2012 හා 2013 වර්ෂයන්හිදී පිළිවෙලින් රු.20,195,265 ක්, රු.31,949,148 ක් හා රු.5,861,199 ක මූල්‍ය අතිරික්තයක් පැවතුනි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

### 4.1 කාර්යසාධනය

----------------

1974 ජනවාරි 10 දිනැති අංක 93/5 දරන ගැසට් නිවේදනය මඟින් පළ කරන ලද සමූපකාර රීතීන්හි 43 වගන්තිය ප්‍රකාර සමූපකාර අරමුදලෙහි මුදල් යෙදවිය හැකි ආකාර පහත පරිදි වේ.

- සමූපකාර අධ්‍යාපනය, ව්‍යාප්ති හා ප්‍රචාරක වැඩ.
- සමූපකාර සමිතිවල කළමනාකරණ කාර්යක්ෂමතා දියුණු කිරීම.
- සමූපකාර සමිතිවලට උපකාර කිරීම.

ඉහත කාර්යයන් ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම අනුව 2014 වර්ෂය වෙනුවෙන් පළාත් සමූපකාර කොමසාරිස් රැස්වීම් 06 ක් පැවැත්වීම සඳහා රු.500,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද රැස්වීම් 2 ක් පමණක් පවත්වා තිබුණි.

(ආ) "නැණ ශක්ති" නමින් පාසැල් වැඩසටහනක් ආරම්භ කිරීමට සමාලෝචිත වර්ෂය තුළදී රු.1,000,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද එවැනි වැඩසටහනක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ ජංගම ගිණුමේ රු. 41,000,000 ක සාමාන්‍ය ශේෂයක් පැවති බැවින් එහි අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2010, 2011, 2012 හා 2014 සිට පැවත එන එකතුව රු. 141,539 ක් වූ හඳුනා නොගත් බැංකු බැර ශේෂ 07 ක් 2016 අගෝස්තු 31 දින වන විටත් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 1974 ජනවාරි 10 දිනැති අංක 93/5 දරන ගැසට් නිවේදනය මගින් පළ කරන ලද සමූපකාර රීතීන්හි 43 වන වගන්තිය ප්‍රකාරව සමූපකාර අරමුදලෙහි මුදල් වැය කළ හැක්කේ සමූපකාර අධ්‍යාපනය, ව්‍යාප්ති හා ප්‍රචාරක වැඩ, සමූපකාර සමිතිවල කළමනාකරණ කාර්යක්ෂමතාවය දියුණු කිරීම හා සමූපකාර සමිතිවලට උපකාර කිරීම සඳහා වුවද ඊට පටහැනි කාර්යයන් 05 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී අරමුදලින් රු.194,143 ක් වැය කර තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සී/ස කොබෙයිගනේ විවිධ සේවා සමූපකාර සමිතියට 2012 වර්ෂයේදී ලබා දුන් රු.3,000,000 ක ණය මුදලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,983,090 ක් හා හිඟ හිටි පොළී ලෙස රු.378,540 ක් අයවීමට තිබුණු අතර මෙම මුදල් අයකර ගැනීමට අරමුදල විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට අක්‍රීය ණය උපලේඛනය අනුව අරමුදලට අයවිය යුතු රු.30,991,460 ක අක්‍රීය ණය ශේෂයෙන් සමාලෝචිත වර්ෂයේදී අයවී තිබුණේ රු.456,854 ක් පමණි. එම අක්‍රීය ණය තුළ සමූපකාර සමිති 20 කට ලබාදී තිබුණු එකතුව රු.8,270,900 ක ණය මුදල්වලින් කිසිදු මුදලක් අයවී නොතිබුණු අතර එම ණය මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ගයන්ද ගෙන නොතිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික සමූපකාර මණ්ඩලයේ ඉල්ලීමකට අනුව වයඹ පළාතෙහි සමූපකාර සමිති හා එම මණ්ඩලය විසින් 2013 වර්ෂයේ පැවැත්වූ බක්මහ උළෙලේ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් මාධ්‍ය ආයතනයක් වෙත ගෙවීම සඳහා සමාලෝචිත වර්ෂයේදී අරමුදලින් රු.3,427,200 ක් ජාතික සමූපකාර මණ්ඩලය වෙත නිසි අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.

(ආ) චක්‍රීය අරමුදල සතුව පැවති රු.378,350,000 ක් වටිනා ස්ථාවර තැන්පතු ඇපයට තබා 2014 වර්ෂයේදී රු.324,000,000 ක ණය මුදලක් ලබාගෙන තිබුණ ද සහල් මෙට්‍රික් ටොන් 4,944.27 ක් ආනයනය කිරීම සඳහා රු.329,288,382 ක් වැය වී තිබුණි. කෙසේ වුවද 2016 සැප්තැම්බර් 30 දින වන විට මෙම සහල් තොගයෙන් රු.77,998,590 ක් වටිනාකමැති සහල් මෙට්‍රික් ටොන් 1171.15 ක් කල් ඉකුත්වීම නිසා මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු වී තිබුණි.

## 4.5 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වයඹ පළාතේ පාසලක සමූපකාර සමිතියක්, ආපනශාලාවක් හා පොත්හලක් පිහිටුවීමට අදාළව ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ උපදෙස් පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලියේ බැහැරව හා විධිමත් ගිවිසුමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී අරමුදල විසින් රු.14,246,171 ක මුදලක් සමූපකාර තොග වෙළෙඳ සංස්ථාවට ලබාදී තිබුණි. නමුත් එම මුදලින් ආපනශාලාවක් හා පොත්හලක් ඉදිකර තිබුණ ද සමූපකාර සමිති පැවැත්වීම සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමෙන් තොරව පාසලේ පිහිනුම් තටාකය සඳහා ප්‍රේෂණාගාරයක් ඉදිකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී අර්තාපල් මිලදීගෙන දිවිනැඟුම ප්‍රතිලාභීන් වෙත නොමිලේ බෙදාහැරීම සඳහා චක්‍රීය අරමුදලින් රු.10,000,000 ක් ඌව පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස් වෙත ලබාදී තිබුණි. මෙයින් මිලදී ගනු ලැබූ අර්තාපල් දිවයිනේ සියළුම දිවිනැඟුම ප්‍රතිලාභීන්ට කිලෝ ග්‍රෑම් 02 බැගින් බෙදාහැරීමට අරමුණු කර තිබුණද බෙදාහැර තිබුණේ ඌවඹ පළාත් දිවිනැඟුම ප්‍රතිලාභීන්ට පමණි. මෙහිදී සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශ ලේකම් හා දිවිනැඟුම දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් අතර පැවති එකඟතාවය මත මෙම මුදල් ලබා දී තිබුණු නමුත් ඒ සඳහා ලිඛිත ගිවිසුමක් නොතිබුණි. මෙම මුදල් 2016 අගෝස්තු 31 දින දක්වා අරමුදල වෙත ප්‍රතිපූරණය වී නොතිබුණු අතර ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් දන්වා තිබුණේ එම මුදල් ප්‍රතිපූරණය කළ නොහැකි බවයි.

(ඇ) 2014 වර්ෂයේ පැවැත්වූ ජාතික සමූපකාර සමුළුව වෙනුවෙන් රු.4,234,932 ක් වැයකර තිබූ අතර රු.3,983,732 ක් ප්‍රචාරක කටයුතු සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව පෞද්ගලික සමාගමක් වෙත ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ් 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ඡේදය ප්‍රකාරව 2014 මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන දින 395 ක් ප්‍රමාද කර 2016 මාර්තු 30 වන දින ඉදිරිපත් කර තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමූපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) ගිණුම්කරණය | | උපයෝගී පොත් යාවත්කාලීන නොකිරීම. |
| (ආ) වත්කම් පරිපාලනය | | නියමිත දිනට භාණ්ඩ සමීක්ෂණ නොපැවැත්වීම. |
| (ඇ) මූල්‍ය පාලනය | (i) | සමූපකාර සමිතිවලින් ණය අයකර ගැනීමේ ප්‍රමාදය හා පසුවිපරම් කටයුතු නිසි පරිදි සිදු නොවීම. |
| | (ii) | අතිරික්ත මුදල් ආයෝජනය නොකිරීම. |

.